ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

LP - QD / 52/ News/ 2013

ක්‍රි. ව. 2013 මැයි 27 සඳුදා
05 වෙළුම - 29 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය



## ජූනි 02 දා

## මුළු ලෝකයම - එකම මොහොතක එකම යැදුමක

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# මුළු ලෝකයම එකම මොහොතක එකට යැදීමේ අපූර්ව අත්දැකීම

## ආදරණීය දුවේ පුතේ...

විශ්වාසයේ වසර මුල් කොට ගෙන විශ්‍රාමික අති උත්තම සොළොස්වන බෙනඩික්ට් සුදෝතුම් පියතුමන් නිර්දේශ කළ විවිධ ආධ්‍යාත්මික ක්‍රියාකාරකම් මේ වසරේ සාර්ථකව ක්‍රියාත්මක වුනා. එතුමන්ගේ විශ්‍රාම යෑමත් සමඟම කතෝලික සසුනේ මුල් පුටුවට පත්වූ අති උත්තම ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමනුත් ඒ කාර්යයභාරය ආධ්‍යාත්මික පන්නරයෙන් ඉදිරියටම ගෙන යන්නට බොහෝ සෙයින් කැප වෙනවා. තවත් විවිධ ක්‍රියාකාරකම් එළිදක්වමින් විශ්වාසයේ වසර ජීවමානව ප්‍රබෝධවත්ව සියළුම සැදැහැවතුන් එයට බද්ධ කර ගනිමින් යන ගමන් මාර්ගයේ තවත් සුවිශේෂී අත්දැකීමකට ජූනි 02 වන දින සියළුම ලෝ වැසි කතෝලිකයින් ගොනු වෙනවා.

ආදර දුවේ පුතේ, ඒ සුවිශේෂී අත්දැකීම තමයි, මුළු මහත් කතෝලික ලෝකය එකම දවසක, එකම මොහොතක, එකට යැදීමට පෙළ ගැස්වීමේ අත්දැකීම. එදින වතිකානයේ ශා. පීතර චතුරශ්‍රයේ සවස 5.00 ට ශු. පැය භක්ති අභ්‍යාසයට සුදෝතුම් පියාණන් සමඟ රෝමයේ රදගුරු වසමේ සියළුම කතෝලික සැදැහැවතුන් එක්තැන් වන විට ඒ වේලාවට සමගාමීව අන් සියළු රටවලත් සියළුම රදගුරු පදවි වල රදගුරු තුමන්ලා සමගින් ඒ කතෝලික ජනතාව ශු. පැය සඳහා එකට රැස්වෙනවා.

ඒ අනුව ශ්‍රී ලංකාවේ වේලාවෙන් රාත්‍රි 8.00 අපිත් අපේ පදවි අනුව ඒ ඒ ආසන දෙව් මැදුරු වලත්, මීසම් වල දේවස්ථානවලත් රැස්වී මේ ශු. පැය භක්ති අභ්‍යාසයට සම්බන්ධ වෙනවා. අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමිපාණන් කොටහේන සා. ලුසියා ආසන දෙව්මැදුරේදී සැදැහැවතුන් සමග ශු. පැය සඳහා එක්වන විට හලාවත, ගාල්ල, රත්නපුරය, කුරුණෑගල , බදුල්ල , මහනුවර , අනුරාධපුරය , මඩකලපුව, ත්‍රිකුණාමලය , මන්නාරම , යාපනය යන රදගුරු පදවි වලත් ඒ වේලාවටම ඒ ඒ පදවි වල රදගුරු තුමන්ලා සමග සැදැහැවත් ජනතාව ශු.පැය භක්ති අභ්‍යාසය සඳහා එකට එක් වෙනවා. බලන්න, අති බලගතු යාච්ඤා අත්දැකීමකට සමස්ත ශු. සභාවම මේ විශ්වාසයේ වසර තුළදී එක් අත්දැකීමක් හරහා බලවත්ව ගොනු වන හැටි.

ආදර දුවේ, පුතේ, කතෝලික සභාවේ විශිෂ්ටත්වයත් එයයි. ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කරන ලද එකම සභාව හැටියට අඛණ්ඩ ඉතිහාසයක් තුළ ආධ්‍යාත්මිකව සවිමත් හා බලවත් වෙමින් කතෝලික සභාව මෙලෙස පෙරට එන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ ප්‍රබල ක්‍රියාකාරිත්වය තුළයි. මිනිස් අත්දැකීමේ ප්‍රබල සංවිධාන ශක්තියට මුල් වන්නේත් ඒ ශුද්ධාත්ම අත්දැකීමමයි. ලෝකයේ වෙන කිසිම ආගමකට මෙවැනි ප්‍රබල සංවිධාන ශක්තියක් හිමි වෙලා නැහැ. ඒ කිසිම ආගමකට දෘශ්‍යමාන ප්‍රබල ආධ්‍යාත්මික නායකත්වයක් උරුම වෙලාත් නැහැ. එකම ආරක යැදීමේ සම්ප්‍රදයකුත් අනික් ආගම් සතුවන්නේ නැහැ. නමුත් ශුද්ධවූ කතෝලික සභාව මේ සියල්ලෙන්ම පොහොසත්. එකම ආරක සම්ප්‍රදයේ දෘෂ්‍යමාන ගමන් මඟක් තුළ සමාජයිය. සංස්කෘතික වශයෙන් සියළු රටවල් වල විවිධත්වයෙන් යුතු ඒකත්වයක් කරා ගමනක් යන්නට ශුද්ධවූ කතෝලික සභාවට බලවත් ආධ්‍යාත්මික ශක්තියක් උරුම වෙලා තිබෙනවා. එය දෙවියන් වහන්සේගේ ප්‍රබල ආශිර්වාදයක්, ඒ වගේම කැපවුනු ශුද්ධවන්ත මිනිසුන්ගේ පුදුමාකාර කැපවීමක්. ඒ වගේම ආදර දුවේ පුතේ, නව සහශ්‍රකයේ උදවීමත් සමඟම කතෝලික සභාවේ බලවත් වර්ධනයක් ඇති වෙමින් තිබෙනවා. ගෙවුනු සහශ්‍රකයේ අවසන් භාගය තුළ විවිධ මූලධර්මවාදී කණ්ඩායම් පටු ආත්ම වාසියට විවිධ ක්‍රියාමාර්ග කතෝලිකයන් අතර ගෙන යන්නට උත්සහ කළත් මේ වකවානුව වන විට ඒ සියළු බලවේග. අභියෝග අභිබවා සමස්ත කතෝලික සභාව ලෝකය පුරාම ප්‍රබල ගමනක යෙදෙනවා.

අද තරුණ පරපුර ඉතාමත් ආදරයෙන් කතෝලික දහම වැළඳ ගන්නට පෙරට එනවා. කේන්ද්‍රයක් මුල් කොට ගනිමින් සෘජු ආගමික වටිනාකම් ලබා දෙන ලෝකයේ ප්‍රබලම ආගමික සංවිධානය හැටියට කතෝලික සසුන තරුණ පරපුර අතර ශුද්ධවූ ඇගැයිමට ලක්වී තිබෙන්නේ එහි තිබෙන ප්‍රබල හරයාත්මක වටිනාකම් පද්ධතිය නිසයි. සාම්ප්‍රදයික විවාහය ආරක්ෂා කරමින් යුධ බිය ලෝකයේ සමනය කරමින්, ආර්ථික අර්බුද හමුවේ නිවැරදිව මඟ පෙන්වමින් පවුල රකින සුවිශේෂී වැඩ සටහන් සවිමත් කරමින්, දහම ජනතාවට බරක් , හිරිහැරයක් හා මවාපෑමක් නොකරමින් ගෙන යන වර්ධනයේ විශ්වාස අත්දැකීම නිසා මුළු ලෝකයේම තරුණ , ළමා පරපුර ඉතාමත් ආදරයෙන් කතෝලික දහම වැළඳ ගනිමින් සිටිනවා. අද ලතින් අමෙරිකානු රටවල පුදුම පිබිදීමක් තිබෙන්නෙ. මූලධර්මවාදී කණ්ඩායම් අද අනාථයි. ඉතා ප්‍රබලව උතුරු ඇමෙරිකාවෙත් කතෝලික දහම ශක්තිමත් වෙමින් පවතිනවා. අප්‍රිකා මහද්වීපයේ හා ආසියා මහද්වීපයේ ජනප්‍රිය ප්‍රබල දහම හැටියට කතෝලික දහම වර්ධනය වෙමින් පවතිනවා. සැදැහැවතුන්ගේ සංඛ්‍යාව එන්න එන්නම වැඩි වෙනවා.

ආදර දුවේ, පුතේ, ඒ මිනිස් ශක්තියේ ක්‍රියාකාරිත්වයෙන් නොවෙයි. දෙවියන් වහන්සේගේ ආශිර්වාදයෙන් ප්‍රබලව ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය කතෝලික සභාව තුළ ක්‍රියාත්මක වන නිසයි. ඉතිං මේ විශ්වාසයේ වසර තුළදි අති උත්තම ප්‍රැන්සිස් පාප්වහන්සේ මේ ප්‍රබල භක්ති ආභ්‍යාසය මගින් නැවතත් මුළු මහත් ලෝකයේම කතෝලික ජනතාව එකම පවුලක දරු කැලක් බවට පත් කරනවා. ඒ දරුවන් වන අපි සියළු දෙනාත් විශ්වාසය වැඩි වර්ධනය කර ගනිමින් ශු. සභා මාතාව සද සුරකිමු.

**ඔබට ජේසු පිහිටයි.**

සංස්කාරක

**ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා**

# ඔබගේ වැඩ කටයුතු කර ගැනීමට දවසට පැය 24ක් මදිද?



තරගකාරී අධ්‍යාපන රැල්ලේ පියාඹන පුංචි ඔබට දිනකට කරන්න තිබෙන වැඩ කටයුතු රාශිය හා සසඳ බලන කල දවසට දී තිබෙන පැය 24 මදි බව හැඟෙන වාර අනන්තය. උදෑසන අවදිවන ඔබ ඇඳෙන් බැස පැමිණෙන්නේ කිරි වීදුරුව පානය කර පාසල් යාම සඳහා සූදානම් වීමටයි. ලහි ලහියේ හැඳ පැළඳ ගන්නා ඔබ යන්ත්‍රානුසාරයෙන් මෙන් පාසල කරා ගමන් කරයි. ඉතිං ඉගෙනීමේ කටයුතු අහවර වී පාසල නිමවුවායින් පසු අමතර පංති හෝ ක්‍රීඩා සඳහා සහභාගිවූ බොහෝ දරුවන් පමාවී නිවෙස් බලා යන්නේ හවස ගතවුවාටත් පසුයි. ඉන්පසු ඇඟපත සෝදගෙන ටිකවේලාවක් ගතවන්න කලියෙන්ම තිරිංදාදිය නාදවෙයි. දේවස්ථානයේ 6.30ට තිරිංදාදිය නාද වූ විගස බොහෝ දරුවන් දිවයන්නේ සාලය දෙසටයි. මේ යන්නේ කුමකටද කියා ඔබ දන්නවා ඇති නේද? ඉස්සර කාලයේ දරුවන් තිරිංදාදිය නාද වූ විගස දණින්වැටී "ස්වාමින්ගේ දූතයා මරිය තුමියට සැලකළේය" කියමින් දේව දියණිය වටා රොක්වී යාච්ඤා කිරීමට පටන් ගනියි.

දැන් දරුවන් 6.30 වන විට දිවයන්නේ "අභීත දියණිය" සමඟ හෝරාවක් ගත කිරීමටයි. අභීත දියණිය සතියේ දින පහේම නිවෙස් තුළට රිංගාගන්නවා. ඉතිං මේ දිනවල දේව දියණිය සුරුවම් කුඩුව තුළට වී කඳුලු සලමින් පුංචි දරුවන් දෙස බලාගෙන ඉන්නවා. එහෙත් කවදාවත් දේව අම්මා පුංචි ඔබ සමඟ තරහ වෙන්නේ නැහැ. ජේසු තුමා සමඟ දේව අම්මා බලාගෙන ඉන්නේ අප මෙතරම් ආදරය කරන අපේ දරුවන්ට අප සමඟ කථා කිරීමට වෙලාවක් නැත්තේ මන්ද කියා. දුර්වල වූත් පාපිවූත් අප වෙනුවෙන් ජේසු තුමා තම වටිනා ජීවිතය පූජා කළා.

ඉතිං දුවේ පුතේ ජේසුස් වහන්සේ අප ජීවිතයේ සිටින ප්‍රධානතම වීරයා කරගත යුතුයි. ජේසු අම්මා අපේම ආදරණීය මව කරගත යුතුයි. දුර්වලවූ අපගේ ජීවිතයට වටිනා තම , අර්ථයක් ලැබෙන්නේ අපේ ජීවිතයේ ප්‍රධාන තැන ජේසුස් වහන්සේට දුන්නොත් පමණයි. නැතහොත් අපේ ජීවිතය සුක්කානමක් නැති වාහනයක් වැනියි. අප ජීවිතය නැමති වාහනයේ සුක්කානම ජේසු තුමාගේ අතට දෙමු. එවිට එතුමාට කැමති ආකාරයට අපගේ ජීවිතය හසුරුවා, අප යා යුතු ඉහලම ස්ථානයට අපව රැගෙන යනවාට කිසිම සැකයක් නැහැ.

ඉතිං පුංචි දුවේ පුතේ කෙසේ හෝ දිනකට අඩ හෝරාවක් වත් දෙවිඳුන් සමඟ කථා කිරීමට යොදු ගන්න. ඔබ සූදනම් වී ඔබගේ දෙමාපියන්වද ඒ සඳහා එකතු කරගන්න. එවිට ඔබගේ මුළු පවුලම දෙවිදුන් ආශිර්වාද කර ආරක්ෂා කර දිනපතාම සතුටින් තබනවා. උදෑසන අවදිවූ විගසත් සුළු මොහොතක් දෙවි පියා සමග කතාකර, ස්තුති කර, දවස එතුමාට භාරදී ඇඳෙන් බසින්න. එවිට ඔබට කවදාවත් දවසේ පැය 24 මදිබවක් දැනෙන්නේ නැත. එදිනෙද ජීවිතයේ කළයුතු සියලුම වැඩ කටයුතු වලට දේව ආශිර්වාදය බහුලව ලැබේවා. නිවැරදි දේ තෝරාගෙන ජීවිතය සාර්ථක කරගැනීමට ඔබට හැකි වේවා. අන් අයගේ දුකට සංවේදී වෙමින් අන් අයටත් පිහිටක් වෙන්න නිතරම උත්සහ කරන්න. එවිට අනිවාර්යයෙන්ම ඔබ දෙවිදුන්ට ප්‍රසන්න යහපත් දරුවෙක් වේවි.

**දිනානි ප්‍රනාන්දු - කටුවපිටිය.**

# අපගේ කැඳවීම තේරුම් ගනිමු

**දෙවිපියාණන් තම දරුවන් වූ අපහට කැඳවීම නැමැති දේව වරප්‍රසාදය විවිධ අයුරින් දානය කර ඇත. එනම් පැවිදි දිවිය තුළ වෙසෙමින් ජේසුස් වහන්සේ එඩේරෙකුගේ වගකීම මගින් කිතුනු ජනතාවට නිසි මඟ පෙන්වීමක් ලබා දීමත් එසේ නැතහොත් ගිහි ජීවිතය තුළ තම දරුවන් හට සැබෑ වූ අධ්‍යාත්මික දියුණුවක් ලබා දීමත්ය.**



මේ සෑම දෙයින්ම වඩා උතුම් වන්නේ අප කුමන අවස්ථාවක කුමන ආකාරයකින් සිටියත් දේව කැඳවීම තේරුම් ගැනීම තුළ දෙවිඳාණන් ප්‍රශංසාවට පත් කිරීමයි. ශුද්ධාත්ම ප්‍රඥාව තුළ දිවි ගමනේ අපට ලැබෙන අවස්ථාවන් තේරුම් ගැනීමට අප උත්සහ කළ යුතුයි.

ජේසුස් වහන්සේගේ දෙවන පැමිණීම ගැන ප්‍රකාශ කරන මතෙව් සුවිශේෂයට අනුව මෙලොව දිවියේ මූලික අවශ්‍යතා ඉටුවන තැන ස්වර්ග රාජ්‍යය ගොඩ නැගේ. එසේ නම් සෑම අයුරින්ම දෙවියන් වහන්සේ අපට ආරාධනා කරනුයේ කිතුනු වටිනාකම් ජීවත් කරන, දේව කැඳවීම තේරුම් ගන්නා ඒ අනුව දිවි මඟ ගමන් කරන කිතුනුවකු වන්නටය.

තවද සලමොන් රජු දෙවිපියාණන්ගෙන් ඉල්ලා සිටියේද ප්‍රඥාව නැමති ශුද්ධාත්ම දීමනාවය. , අපත් සිතිය යුත්තේ ද ඉල්ලා සිටිය යුත්තේද බලයවත්, ආයුෂවත් නොව, දේව සැලැස්ම හෙවත් දේව කැඳවීම තේරුම් ගැනීමට අවශ්‍ය කරන ප්‍රඥාවය.

**අශානි නවින්ද්‍යා තමෙල්**
**09 ශ්‍රේණිය**
**ශු. පවුලේ බාලිකා මහා විද්‍යාලය - වෙන්නප්පුව**

# වැස්ස



**කළු වලා නැග එමින් අහස පුරා මැවෙනවා**
**විදුලි වේගයෙන් දසතම අකුණු ගහනවා**
**වැස්සක පෙර නිමිතිය මේ කියා පානවා**
**සුලං හමනවා සද්දෙන්, විදුලියද කොටනවා**

**පොඩ්ඩ පොඩ්ඩ වැහි බිංදු වැටෙනවා**
**එක පාරට මහ වැස්සක් කඩා වැටෙනවා**
**අපේ පාරේ කානු පිරී වතුර ගලනවා**
**වැහිළිහිනියෝ අහසේ පියා සලනවා**

**අනන්ත ප්‍රභාෂ්වර**
10 ශ්‍රේණිය
**ශු. පවුලේ දහම් පාසල - බිබිල**



**මාසික සිතිවිල්ල**
"මැයි මාසය"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

**" මාසික සිතිවිල්ල " ජයග්‍රාහී නිර්මාණය ලබන සතියේ පළ කෙරේ**

# ඉගෙන ගැනීමට අධෛර්ය නොවෙමු

**එක නගරයක පුතාල දෙන්නෙක් ඉන්න පවුලක් සිටියා. ලොකු පුතාගෙ නම අජිත් පොඩි පුතාගෙ නම රියාල්. නමුත් හැමෝම ඔවුන්ට කීවේ ''අයියා'' හා ''මල්ලී'' කියා.**

අයියා ඉගෙන ගැනීමට හරි සූරයි. කියවීමටත් හරිම ලැදියි. නමුත් මල්ලීගේ කල්පනාව තිබුණේ හැම මොහොතේම සෙල්ලම් කරන්න එළියට දුවන්න පමණයි.

දිනපතා පාසලෙන් පසු කළයුතු අභ්‍යාස මල්ලී ලවා කරවීමට දෙමව්පියන්ට බොහොම වෑයමක් දරන්න සිදු වුනා. නිතරම මල්ලී බලන් ඉන්නේ කොයි මොහොතේ බෝලය අරන් වත්තට දුවන්නද කියලා.

කාලයක් යන විට දරුවො දෙන්නා වැඩි වයසට පත් වෙමින් සිටියා.

අයියා නිතරම පන්තියේ සම්මාන ගැනීම ගැන දෙමාපියන් නිතරම කියා පෙන්වීම ගැන මල්ලිගේ හිතට හරිම අසහනයක් ඇති වුනා. අයියා ඉගෙන ගැනීමට දක්ෂයෙක් වුනත්, මල්ලිට පුදුම දක්ෂතාවයක් තිබුණා චිත්‍ර ඇඳීමට. නමුත් දෙමාපියන් අයියාගේ සමත්කම් විදහා දක්වන අයුරින්ම මල්ලිගේ චිත්‍ර ඇඳීම ගැන අගය කළේ නැහැ. මෙය මල්ලීට කනගාටුවට හේතුවක් වුණා.

මේ පසුබිම තුළ මල්ලීගේ අධ්‍යාපනික කටයුතු අඩාල වුනා. පන්ති භාර ගුරුතුමියට මෙය ප්‍රශ්නයක් වුණා. ඇය දෙමාපියන් පාසලට ගෙන්වා මේ ගැන සාකච්ඡා කළා.

සාකච්ඡාවේදී ගුරුතුමියට සහ දෙමාපියන්ට තේරුම් ගියා අයියාට ඇති දක්ෂකම් තමාට නොමැති නිසා ''ඉගෙන ගත්ත කියල ඇති පලේ මොකක්ද'' යන විශ්වාසය ගැන මල්ලී තරයේම විශ්වාස කරන බව.

දොලොස්වන ශ්‍රේණියේ විභාග යට ඇත්තේ තව මාස කීපයක් පමණයි. දෙමාපියන් මේ තත්ත්වය මත කුමක් කරන්නදැයි නොදැන ඉතාම අසහනයකින් සිටියා.

දිනක මේ වාතාවරණයෙන් ඇති වූ පීඩනය විඳ දරා ගත නොහැකි තැන, දරුවන්ගේ මව ඇයගේ පවුලේ ළඟම නැන්දා කෙනෙකු



සමග මෙම ප්‍රශ්නය ගැන සාකච්ඡා කළා. ඇයගේ උපදේශය වූයේ වහාම විශේෂ පන්තියකට මල්ලීව යැවිය යුතු බවයි. මල්ලීටත් ටිකෙන් ටික තමා වැටීමට යන කරදරයෙහි ඇති බරපතළ කම ගැන වැටහී ගෙන එමින් තිබුණා. ඔහු කැමැත්තෙන්ම විශේෂ පන්තියට යන්නට පටන් ගත්තා.

දිනක් කඩ සාප්පුවකට ගිය විටෙකදී එහි තිබී ඉතාමත් ලස්සන පින්තූර රාමුවකට මේ නැන්දගේ ඇස ගියා. එය දුටු සැනින් ඇයට මල්ලී මතක් වුනා. ඇයට සිතුණා මල්ලී ලවා ලස්සන චිත්‍රයක් අන්දවා ගන්න. ඇයට වැටහුණා, එයින් මල්ලීගේ ආත්ම විශ්වාසය වැඩිකළ හැකි බව.

මල්ලීගේ දෙමාපියන්ගේ අනුමැතිය ඇතිව චිත්‍රය ඇඳීමේ වැඩ කටයුතු මල්ලිට භාර දුන්නා. ඇඳිය යුතු චිත්‍රය කුමක්ද කියාත් ඇය මල්ලීට කීවා.

මල්ලී ඉතාමත් දර්ශණීය ලෙසට එම චිත්‍රය නිමා කළා. නැන්දා එය ඇගේ සාලයේ එල්ලුවා. එය දුටු හැම දෙනෙක්ම මල්ලීගේ දක්ෂකම වර්ණනා කළා. එයින් මල්ලීගේ හිත පැහැදුනා. අයියාට මෙන්ම තමාටත් විශේෂ දක්ෂතා තියන බව මල්ලී තේරුම් ගත්තා.

මල්ලීගේ ආත්ම විශ්වාසය වර්ධනයවීමත් සමගම, තමන්ගේ ඉගෙනීමේ කටයුතු ද ආශාවෙන් කළ නිසා මල්ලීට අවසාන විභාගය සාර්ථක ලෙස අවසන් කිරීමට හැකි වුනා. ගුරුතුමියත්, දෙමව්පියන් සමග විශේෂයෙන් නැන්දාත් මල්ලීගේ ප්‍රතිඵල දැනගත් පසු ඉතාමත් සතුටට පත් වුනා. පසු කලෙක මල්ලී කාර්මික විද්‍යාලයක වැඩිදුර අධ්‍යාපනය ලැබුවා. ඉන් ලත් දැනුමින් ඔහුට හොඳ රැකියාවක් සොයා ගන්නට ද පුලුවන් වුනා.

ඔහු විවාහ වී දරු මල්ලන් ලැබුණු පසුත්, මේ සිදුවීම ඔහුගේ සිතෙහි තදින්ම කාවැදී තිබුණා.

දරුවෙකු හට ආත්ම විශ්වාසය කෙතරම් වටිනා දෙයක් දැයි තමාගේ අත්දැකීම් තුළින්ම වටහා ගත් ඔහු නිතර දෙවේලේ තම දරුවන් ඇතුලු අනෙකුත් දරුවන්ටද, ඔවුනොවුන්ගේ හැකියාවන් ඔප මට්ටම් කර ගැනීමෙන් ජීවිතය ඔපවත් කරගන්නේ කෙසේදැයි නිතරම පහදා දුන්නා.

**ප්‍රීඩා විල්ලවරායන්**
**ටොරොන්ටෝ , කැනඩාව**

# 2013 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## පළමු තේමාව ඇසුරෙන් පළවූ ප්‍රශ්න වලට පිළිතුරු (ප්‍රශ්න අංක 77 සිට 85 දක්වා පිළිතුරු)

77. ★ ඉගැන්වීමෙහිද , සහභාගීත්වෙහිද, රොටී කැඩී මෙහිද, යාච්ඤාවෙහිද නිරත වීම
★ තමන් සතු දේ අන් අය සමග බෙදා ගැනීම
★ අපොස්තුළුවරුන්ගේ ඉගැන්වීම පිළිගෙන ඒ අනුව ජීවිතය සකස් කරගැනීම

78. සාධාරණත්වය, සත්‍යය වෙනුවෙන් තම ලේඛන හැකියාව යොදාගැනීම හා ඒ වෙනුවෙන් ජර්මන් වධකාගාරයේ සිරකරුවකු වීම

★ ප්‍රැන්සිස් නැමති මරණයට නියමව සිටි සිරකරුවෙක් වෙනුවෙන් ජීවිතය පරදුවට තැබීමට එඩිතර වීම
★ අන් අයගේ තර්ජනවලට නොබියව මුහුණ දීම
★ යාච්ඤාව හා පශ්චත්තාපික ක්‍රියා මගින් ලෝකයේ පාපී බලවේග තුරන් කිරීමට කටයුතු කිරීම.

79.
★ රෝගී දුගී අසරණ අනාථ ළමුන්ට සේවය කරන මධ්‍යස්ථානයක් බවට කල්කටාව පත් කිරීම
★ ඒඩ්ස් වැනි භයානක රෝගීන් බලාගැනීමට ඉදිරිපත් වීම
★ මරණාසන්නව පාරේ වැටී සිටින මනුෂ්‍යයෙකුට මැරෙන්නට හැකි හිතකාමී පරිසරයක් ගොඩනගා දීම
★ දයාවේ ධර්මදූතික නිකාය.

80.
★ නොවරදින සුළුභාවය යනුවෙන් අදහස් කරන්නේ ධර්මය (විශ්වාසය) හා සදාචාරය පිළිබඳ කටයුතු ගැන විශ්වාස කිරීමේදීත්, ඉගැන්වීමේදීත් ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ලබන විශේෂ අනුග්‍රහය හේතුකොටගෙන සභාවට නොවරදින බවයි.

81. ★ ශුද්ධ ලියවිල්ල
★ සම්ප්‍රදාය ★ සභා ඉගැන්වීම්

82. ★ අපට ප්‍රකාශවන දෙවියන් වහන්සේට ශ්‍රද්ධාවෙන් යුතුව පිළිතුරු දෙමු.

★ ඔවුන්වහන්සේට අපේ බුද්ධිය හා නිදහස් කැමැත්ත පවරා දෙමින් දේව කැමැත්තට අවනත වෙමු.

★ සම්පූර්ණ කැමැත්තෙන් දෙවිඳුන්ට සවන් දෙමු.

★ දේව වචනය අසා ඒ ගැන විශ්වාසයෙන් හා කැපවී මෙන් යුතුව කටයුතු කරමු.

★ දේව අනාවරණයට අවනතව විශ්වාසයෙන් පිළිතුරු දෙමින් , ගැලවීමේ මාර්ගය උදාකර ගනිමු.

★ වගකීමෙන් හා කැපවීමෙන් අපේ කාර්යයන් ඉටු කිරීමෙන් ක්‍රිස්තුවරයාණන් ආදර්ශනය කරමු.

83.
★ පෘතුගීසි ධර්මදූතවරු ලාංකීය ජන ජීවිතයට ඉතා සමීප පිරිසක් වීම.

★ දේශීය භාෂා ඉගෙනගෙන ධර්මය ප්‍රචාරය කිරීම

★ ධීවර ජනාවාස ප්‍රදේශවලින් ධර්ම ප්‍රචාරක කටයුතු ඇරඹීම

★ සියලුම ජනකොටස්වලට එක හා සමාන ලෙස සැලකීම
★ සරල අල්පේච්ඡ ජීවිතය

84. ★ ප්‍රැන්සිස්කන් පැවිදි නිකාය.

85. ★ ප්‍රැන්සිස්කන් පැවිදි නිකාය
★ ජේසු නිකාය
★ දොමිනිකානු නිකාය.
★ අගුස්තීනු නිකාය

ගරු ඩේමියන් පෙරේරා පියතුමා




# පොල්ගහඅගාර ආරෝග්‍ය දේව මාතා දහම් පාසල

කුරුණෑගල කතෝලික රදගුරු පදවියේ දූනකදෙනිය මීසමේ පොල් ගහඅගාර ආරෝග්‍ය දේවමාතා දෙව් මැදුර මෙම වසරෙදී සියවස සමරන්නීය. එසේම විශ්වාසයේ ඉතිහාසය තරමටම , ධර්මෝපදේශ සේවාවද පැරණිය. වර්තමානයේ මෙන් ක්‍රමානුකූල නොවුවත් එම කාලයට ගැලපෙන පරිදි විශේෂයෙන්ම කිතුනු විශ්වාසය ආරක්ෂා කර ගැනීමෙහි ලා අප මුතුන් මිත්තන් දැක්වූ පරිත්‍යාගය ගෞරවාන්විතව සිහිපත් කිරීම වටී.

වර්තමාන මිසම් සේවක ගරු ක්‍රිස්ටි ලෙනාඩ් පූජාප්‍රසාදින් වහන්සේ හා මීසම් සහයක ගරු ඇන්ටන් ක්‍රිස්ටි පූජාප්‍රසාදීන් වහන්සේ අප දහම් පාසලේ අභිවෘද්ධිය සඳහා නිරතුරු දායකත්වය සපයති.

රීටා ප්‍රනාන්දු ප්‍රධාන දහම් ගුරුතුමිය සමග දහම් ගුරු භවතුන් 14 දෙනෙකු පමණ සේවයේ යෙදෙති. 1 - 11 ශ්‍රේණි දක්වා ළමුන් 145 දෙනෙකු ඉගෙනුම ලබන අතර 2013 කුරුණෑගල පදවි බයිබල් අපෝස්තලික සේවාව මගින් පවත්වන ලද කථික හා ශු. බයිබලය කියවීමේ තරගයෙන් විශිෂ්ට ප්‍රතිඵල දැක්වීමට දැරියන් හතර දෙනෙකු සමත් විය. දහම් පාසල තුළ කෙරෙන සෑම කටයුත්තකදීම සුළු පිරිසක් වුවද ''දෙමාපිය කමිටුව'' හරහා දරුවන්ගේ දෙමාපියන් ගෙන් ලැබෙන සහයෝගයද ප්‍රශංසා කටයුතුය.

ජූඩ් ප්‍රැන්සිස් - දහම් ගුරු



දහම් පාසල් ආචාර්ය මඬුල්ල



බයිබල් තරගයෙන් ජය ලැබූ ළමුන්

## ළමා ප්‍රදීපය කැමරා කාචයේ සටහන් වූ බක්මහ අසිරිය



ගරු ෆ්‍රෑන්ක් තිසේරා පියතුමන් විසින් පවත්වාගෙන යනු ලබන සාන්තානා ළමා නිවාස (සළනි) දෙමන්හන්දිය, ලුණුවිල හා තුම්මෝදර නිවාසයන්හි දූ දරුවන් පසුගියදා තුම්මෝදර සළනියට එක් වී සිංහල අවුරුදු උත්සවය පැවැත්වූ අයුරු

**(පසුගිය සතිය හා සබැඳේ.....)**

**27. බෙදුනු කිතුනුවන් බොහෝවිට පවසන ලෙස ක්‍රිස්තු ධර්මය ශුද්ධ බයිබලයට පමණක් සීමා විය යුතුද? ශුද්ධ බයිබලයෙන් පිට කිතු දහමක් විය හැකිද? දේව ධර්ම දැනගැන්මේ එකම මග ශුද්ධ බයිබලයද?**

ක්‍රිස්තුන් වහන්සේ දෙසූ ධර්මය ශුද්ධ බයිබලයට පමණක් සීමා කළ නොහැක. මාක් තුමන්ගේ සුවිශේෂය කෙටි ග්‍රන්ථයක් වන අතර එහි සඳහන් නොවූ ඇතැම් කරුණු මතෙව් තුමාගේ සුවිශේෂයෙහි සඳහන් වේ. මේ දෙකේම නැති තොරතුරු ලූක් තුමන්ගේ සුවිශේෂයෙහි සඳහන් වී ඇති අතර, මේ සුවිශේෂ තුනෙහිම නැති කරුණු රැසක් ජොහන් තුමාගේ සුවිශේෂයෙහි සඳහන් වෙයි. තවද, තම සුවිශේෂයේ අවසානයේදී ජොහන් තුමා මෙසේ පවසයි: ''ජේසුස් වහන්සේ කළ තවත් බොහෝ දේ ඇත. ඒවා එකින් එක ලිව්වොත්, ලියවෙන ඒ පොත්වලට මුළු ලෝකය වුවත් ඉඩ මදි යයි සිතමි'' (ජොහන් 21:25) ක්‍රිස්තුන් වහන්සේ ගැන ලියවිය යුතු තවත් බොහෝ දේ තිබුනු බව මෙයින් සනාථ වන බැවින් උන්වහන්සේ දෙසූ ශුභාරංචිය සම්පූර්ණ වශයෙන් නව ගිවිසුමෙහි (ශුද්ධ බයිබලයෙහි ) අඩංගු වී ඇතැයි සිතීම යුතු නොවේ.

අපෝස්තුළුවරුන්ගේ අභාවයෙන් පසුව ශුද්ධ බයිබලයේ ග්‍රන්ථාවලිය පියවිණි. එහි නොලියැවුණු එහෙත් ශුද්ධවූ සභාවේ තිබුණු ශුභාරංචිය පසු කාලයේදී ලේඛනාරූඪ වුවද, ඒවා ශුද්ධ බයිබලයේ නොවී ය. මෙසේ, ශුද්ධ බයිබලයේ (නව ගිවිසුමේ) ඇත්තේ ක්‍රිස්තුන් වහන්සේගේ ශුභාරංචියේ කොටසක් පමණි. මුළු ශුභාරංචිය ඇත්තේ අපෝස්තුළුවරුන් ගෙන් එය ලබාගත් ශුද්ධවූ සභාවෙහිය. එබැවින් ක්‍රිස්තුන් වහන්සේගේ ධර්මය ශුද්ධ බයිබලයට පමණක් සීමා කිරීම වැරදි ය.

**28. එසේනම්, ඒ ධර්මය ඇත්තේ කොහේද?**

ක්‍රිස්තු ධර්මය සම්පූර්ණ වශයෙන් ඇත්තේ උන්වහන්සේ විසින් ස්ථාපනය කරන ලද ශුද්ධවූ සභාවෙහි ය. ප්‍රධාන වශයෙන්, ධර්මය ක්‍රිස්තුන්වහන්සේආශ්‍රයෙන්ඉගෙනගන්නටත්මැනවින්අවබෝධ කර ගන්නටත් අවකාශ ලද අපෝස්තුළුවරුන් සමඟ වන අතර, උන්වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසුව, නව ක්‍රිස්තු අනුගාමිකයන් උන්වහන්සේගේ ධර්මය ඉගෙනගත්තේ අපෝස්තුළුවරුන් ප්‍රමුඛ ක්‍රිස්තු ශ්‍රාවකයන්ගෙනි.

නව ගිවිසුමේ ප්‍රථම ග්‍රන්ථය ලියන ලද්දේ ශුද්ධවූ පාවුලු තුමන් විසින් ය. එනම් එතුමන් වර්ෂ 50 දී පමණ තෙසලෝනිකවරුන්ට ලියූ ලිපිය යි. අන්තිම ග්‍රන්ථය වන්නේ වර්ෂ 100 දී පමණ ලියැවුණු පේදුරු තුමන්ගේ දෙවන හසුන යි. ක්‍රිස්තුන් වහන්සේ දෙසූ ධර්මය ගැන ග්‍රන්ථ කීපයක්ම ලියැවී තිබුන ද, ඒවා අතරින් ග්‍රන්ථ 26 ක් පමණක් නිර්වද්‍ය දේව වචනය ලෙස ශුද්ධවූ සභාව විසින් පිළිගෙන එම ග්‍රන්ථ නව ගිවිසුම ලෙස ප්‍රකාශ වූයේ වර්ෂ 393 න් පසුවය. මෙම ග්‍රන්ථ ලිවීමටත් නව ගිවිසුම සකස් වීමටත් පෙර කාලයේ සිටි ක්‍රිස්තු භක්තිකයන් ශුද්ධ බයිබලයක් නැති ක්‍රිස්තු භක්තිකයන් වූ අතර ඔවුන් ශුද්ධවූ සභාවෙන් (එනම් අපෝස්තුළුවරුන් ගෙන් සහ ඔවුන්ගෙන් පසුව සභානායකයන් වූ ඔවුන්ගෙ ගෝලයන්) කිතු දහම ඉගෙන ගත් බව අප හොඳින් මතක තබා ගත යුතුය.

එබැවින් ශුද්ධ බයිබලයේ ඇත්තේ ක්‍රිස්තුන් වහන්සේ දෙසූ ධර්මයේ ලිඛිත කොටස පමණි. මුළු ධර්මය ඇත්තේ, අපෝස්තුළුවරුන්ගෙන් එය ලබා ගත් කිතු සසුනෙහි ය. කතෝලික සභාව , එම අපෝස්තුළුවරුන්ගෙන් පැවත එන එකම ශුද්ධවූ සභාව යි. දේව ධර්මය දැනගැනීමට ශුද්ධ බයිබලයත් ශුද්ධවූ සම්ප්‍රදායත් දෙකම, අවශ්‍ය වන බව මෙයින් මැනවින් වැටහේ. ශුද්ධ බයිබලයෙන් පමණක් කිතු දහම ලබාගත් කිතුනු සභාවලත් මූලධර්මවාදී කණ්ඩායම්වලත් ඇත්තේ ක්‍රිස්තුන් වහන්සේගේ ධර්මයෙන් අඩක් පමණි.

**29. ශුද්ධ බයිබලය බිහිවීම වෙනුවෙන් කතෝලික සභාවේ දයකත්වය කුමක්ද?**

දේව වචනය අඩංගු පැරණි ගිවිසුම සහ නව ගිවිසුම එකතු කර ශුද්ධ බයිබලය නමින් ලොවට දනය කළේ ශුද්ධවූ සභාවයි.

ක්‍රිසතුන් වහන්සේගේ යුගයට පෙර පැවති යුගයේදී දේව වචනය ග්‍රන්ථ 46 ක් තුළ අඩංගු වී තිබුණි. ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය සහ ස්වර්ගාරෝහණයට පසුව උන්වහන්සේ දෙසූ දහම පිළිබඳව ග්‍රන්ථ කීපයකම ලියැවී තිබුණු අතර, එයින් 27 ක් පමණ ශුද්ධාත්මානුභාවයෙන් ලියැවුණු නිර්වද්‍ය ග්‍රන්ථයන් ලෙස , වර්ෂ 393 දී හිප්පෝ හි දී සහ වර්ෂ 397 සහ 419 දී කාර්තේජ හි දී පවත්වන ලද මන්ත්‍රණ සභාවන් විසින් අනුමත කරන ලදි. ඉන්පසුව, මෙම ග්‍රන්ථ 27 නව ගිවිසුම යනුවෙන් ද, ක්‍රිස්තුන් වහන්සේගේ යුගයට පෙර තිබු ග්‍රන්ථ 46 පැරණි ගිවිසුම යනුවෙන් ද නම් කර මෙම ගිවිසුම් දෙක එකට සම්බන්ධකොට සම්පූර්ණ දේව වචනය ශුද්ධ බයිබලය නමින් ලොවට ඉදිරිපත් කළේ ශුද්ධවූ සභාවයි.

# කතෝලික සභාවේ විශිෂ්ටත්වය

නව ගිවිසුම බිහිව නොතිබුනු කාලයේදී සහ එය අතින් ලියැවුණු කාලයේදී දේව වචනය ජනතාවට පහදා දුන්නේ ද, සියවස් ගණනාවක් පුරා ශුද්ධ බයිබලය විනාශ කිරීමට ඉඩනොදී සතුරාගෙන් එය සුරැක්කේ ද, මුද්‍රණ ශිල්පය නොතිබුණු මුල් යුගයේදී ශුද්ධ බයිබලය පිටපත් කළේ ද කතෝලික සභාවයි.

හෙබ්‍රෙව් ග්‍රීක් භාෂාවෙන් ලියැවී තිබුනු පැරණි සහ නව ගිවිසුම් වර්ෂ 382- 400 අතර කාලයේදී සම්පූර්ණයෙන්ම ලතින් භාෂාවට පරිවර්තනය කළේ කතෝලික තාපසකයෙකුවූ සාන්ත ජෙරෝම් තුමා බව මින් ඉහත 24 හි දී සඳහන් කර ඇත. ''වල්ගේට්'' නම් මෙම ලතින් පරිවර්තනය, ලෝකයේ විවිධ භාෂාවන්ට ශුද්ධ බයිබලය පරිවර්තනය කිරීමේදී මුල් පිටපත ලෙස යොදාගැනීම , කතෝලික සභාවේ දායකත්වයේ විශේෂත්වයකි.

තවද වර්ෂ 1227 දී (කැන්ටබරි හි අගරදගුරු ස්ටීවන් ලැන්ග්ටන් විසින්) සහ වර්ෂ 1248 දී (දෙමිනිකානු කාර්දිනල් හියුගෝ විසින්) ශුද්ධ බයිබලය අංකනය කරන ලදී.

එබැවින් දේව වචනය (පැරණි සහ නව ගිවිසුම් ) අඩංගු ශුද්ධ බයිබලය බිහිවූයේ කතෝලික සභාව හේතුවෙන් පමණක්ම බව අපට නිශ්චිතවම කිව හැකි ය. ශුද්ධ බයිබලයේ අඩංගු වී ඇත්තේ දේව වචනය බව මුළු ලෝකයටම සනාථ කළේ ශුද්ධවූ සභාවයි.

**30. මූලධර්මවාදීන් පවසන ලෙස, අපට ගැලවීම ලැබෙන්නේ ශුද්ධ බයිබලයේ සඳහන් දේ පිළිපැදීමෙන් පමණද? කතෝලිකයන් "ශුද්ධවූ සම්ප්‍රදාය" සහ "සභා ඉගැන්වීම්" ගැන පවසන්නේ ඇයි?**

ගැලවීම ලැබීමේ එකම මාර්ගය ක්‍රිස්තුන් වහන්සේය. උන්වහන්සේ දෙසූ ධර්මය මුළුවශයෙන් ශුද්ධ බයිබලයේ අඩංගු නොවන බවත්, එය සම්පූර්ණ වශයෙන් ඇත්තේ උන්වහන්සේ විසින්ම ස්ථාපනය කළ ශුද්ධවූ සභාවෙහි පමණක් බවත්, මීට පෙර 28හි සවිස්තරව සඳහන් කර ඇත. එබැවින් , ගැලවීම ලබාගැනීමට නම් ශුද්ධ බයිබලය ද, ශුද්ධවූ සම්ප්‍රදාය ද, සභාඉගැන්වීම් ද අනුව ජීවත් විය යුතුය.

සාමාන්‍ය සභා සිරිත්විරිත් ''ශුද්ධවූ සම්ප්‍රදාය'' ලෙස සැලකිය නොහැක. ක්‍රිස්තුන් වහන්සේ සහ ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් අපෝස්තුළුවරු වෙත පවරන ලද්දාවූ දේව වචනය අති පාරිශුද්ධ ලෙස දේව ජනතාවට බාරදෙනු ලබන ක්‍රියාවලිය ශුද්ධවූ සම්ප්‍රදාය යි. අපෝස්තුළුවරුන් ගෙන් පැවත ආ සම්ප්‍රදාය අද දක්වා අඛණ්ඩව ශුද්ධවූ සභාව තුළ වර්ධනය වෙමින් පවතී. සත්‍ය ක්‍රිස්තු ධර්මය ඉගැන්වීම පහදදීම වෙනුවෙන් ශුද්ධාත්මානුභාවයෙන් මෙය අඛණ්ඩව සිදුවෙමින් පවතින බව ජේසු සමිඳුන්ගේ (පහත සඳහන් ) වදන් තුළින් මැනවින් සනාථ වේ:-

1. ''ඔබ සමග සිටින අතර මම මේ දේවල් ඔබට කීවෙමි. එහෙත් මාගේ නාමයෙන් පියාණන් වහන්සේ එවන සහයදායකයාණන් වහන්සේ එනම්, ශුද්ධාත්මයාණන් වහන්සේ සියල්ල ඔබට උගන්වමින් , මා වදාළ සියල්ල ඔබට සිහිපත් කරවන සේක.'' (ජොහන් 14:25-26)

2. ''ඔබට කීමට තව බොහෝ දේ මට ඇත එහෙත්, දැන් ඒවා දරාගැනීමට ඔබට නොහැකි ය. එසේ වී නමුත්, ඒ තැනැන් වහන්සේ, එනම් සත්‍යතාවේ ආත්මයාණන් වහන්සේ පැමිණි කල, උන්වහන්සේ සම්පූර්ණ සත්‍යය කරා යෑමට ඔබට මග පෙන්වන සේක. මන්ද, උන්වහන්සේ සිය කැමැත්තෙන් ම කතා නොකොට, උන්වහන්සේ අසන දේ ම පවසා මතු සිදුවන දේ ඔබට ප්‍රකාශ කරනු ඇත'' (ජොහාන් 16:12-13)

නව ගිවිසුමේ ග්‍රන්ථ ලියවීමට පෙර දේව වචනය මුල් කිතුනු ජනතාවට පහදා දුන්නේ ශුද්ධවූ සභාවයි. නව ගිවිසුමෙහි අඩංගු සියල්ලම ලියවුනේ මුල් කිතුනු සභාවේ ''ශුද්ධවූ සම්ප්‍රදාය'' සහ ''සභා ඉගැන්වීම්'' මතය. සභා සම්ප්‍රදායන් සහ ඉගැන්වීම් හි වැදගත්කම පිළිබඳව පාවුලු තුමන් මෙසේ පවසයි: ''එබැවින් සහෝදරවරුනි, ස්ථිර ව සිට, අපගේ දේශනා කිරීමෙන් හෝ අපගේ හසුනින් හෝ අප ඔබට ඉගැන්වූ සත්‍යයන් හොඳින් සිතට ගන්න'' (2 තෙසලෝනික 2:15). සම්ප්‍රදායයන් සහ ඉගැන්වීමේ නිල අධිකාරියක් නොමැති මූලධර්මවාදීන් , කතෝලික සභාවේ ශුද්ධවූ සම්ප්‍රදාය සහ ඉගැන්වීම් සැහැල්ලුවට පත්කිරීම පුදුමයක් නොවේ.

**නිමි.**

✍ **වික්ටර් සිල්වා**



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 95

## Shall / Should / Will / Would

**පසුගිය පාඩම හා සම්බන්ධයි**

## Would

Would කියන වචනෙ සාමාන්‍යයෙන් ගණන් ගැනෙන්නේ Will කියන වචනයේ අතීත පදය විදිහට. would නොයෙකුත් අදහස් ප්‍රකාශ කිරීම සඳහා භාවිත වෙනවා.

**1. අනාගත තත්ත්වයන් ගැන කීමට අපි *would* භාවිත කරනවා.**

If you study you **would** pass the exam.
(ඉෆ් යූ ස්ටඩි යූ වුඩ් පාස් දි එක්සෑම්)
ඔබ පාඩම් කළොත් පාස් වේවි.

- It **would** be nice to have a holiday.
(ඉට් වුඩ් බී නයිස් ටු හැව් අ හොලි ඩේ)
නිවාඩුවක් තිබුනනං හරි හොඳයි
(උපකල්පනයෙන් අනාගතය ගැන කීමට)

- I **would** stay if I could. But I really have to go.
(අයි වුඩ් ස්ටේ ඉෆ් අයි කුඩ් බට් අයි රියලි හැව් ටු ගෝ)
මට පුළුවන්කමක් තිබුන නං මම ඉන්නවා. ඇත්තටම මම දැන් යන්න ඕන.

**2. අපි *Conditional Sentences* (කන්ඩිෂනල් සෙන්ටෙන්සස්) ගැන කලින් ඉගෙන ගත්තා ඔබට මතක ඇති. මේ වැකිවලදී අපි *would* යෙදූ හැටි නැවත මතක් කරගන්න.**

3. ඒ වගේම **"reported speech"** වලදිත් අපි **would** යොදන බව ඔබට මතක ඇති. (පසුගිය පාඩම් බලන්න)

- Tony said he would phone me yesterday.
(ටෝනි සෙඩ් හී වුඩ් ෆෝන් මී යස්ටර් ඩේ)
ටෝනි මට ඊයෙ කෝල් කරනවා කිව්වා.

- Shirani promised that she wouldn't be late.
(ශිරානි ප්‍රොමිස්ට් දැට් ෂී වුඩ්න්ට් බී ලේට්)
ශිරානි පොරොන්දු වුනා එයා ප්‍රමාද වෙන්නෙ නෑ කියල.

**3. වඩා ශිලාචාර විදිහට යමක් ඉල්ලීමට අපට *would* යොදන්න පුළුවන්.**

- **Would** you help me? (වුඩ් යූ හෙල්ප් මී?)
මට උදව් කරනවද?
Yes! certainly I **would** (යර්ස්! සර්ටන්ලි අයි වුඩ්)
ඔව්, සත්තකින්ම මම ඔබට උදව් කරනවා.

- **Would** you please give the message to Sheela?
(වුඩ් යූ ප්ලීස් ගිව් ද මෙසේජ් ටු ශීලා?)
ශීලාට කරුණාකරල පණිවුඩේ කියනවද?

**4. ඒ වගේම කැමැත්ත, රුචි බව පිළිබිඹු කරද්දිත් *would* යොදන්න පුළුවන්**

- I **would** like to ask you a question.
(අයි වුඩ් ලයික් ටු ආස්ක් යූ අ ක්වෙස්ෂන්)
මම ඔබෙන් ප්‍රශ්නයක් අහන්න කැමතියි.

- I **would** like to help you with your home work.
(අයි වුඩ් ලයික් ටු හෙල්ප් යූ විත් යුවර් හෝම් වර්ක්)
ඔබේ ගෙදර වැඩ කරන්න උදව් කරන්න මට පුළුවන්.

# ක්‍රිස්තියානි කලාව හා වන්දනාව 16

## දේවස්ථාන ගොඩ නැඟීමේ කලාව

### දේවස්ථාන ගොඩ නැඟීමේ කලාව

ක්‍රිස්තියානිය ක්‍රි.ව. 310 පසුව නිදහස් ආගමක් බවට පත්වීමත් සමගම ක්‍රිස්තු භක්තිකයෝ හැකිතාක් ඉක්මනට විසඳා ගතයුතු වූ එක ප්‍රශ්නයක් විය. එය බැතිමතුන් එක් රැස්වන ස්ථාන හෙවත් දේවස්ථාන පිළිබඳ ප්‍රශ්නය ය. ඒ දක්වා ක්‍රිස්තියානියට එකම දේවස්ථානයක්වත් තිබුණේ නෑ.

ආගමික අභ්‍යාස සඳහා බැතිමතුන් හොර රහසේ එක් රැස් වුනේ එක් එක් නිවෙස් වලය. එහෙත් දැන් දේවස්ථාන නමින් හැඳින්වෙන ප්‍රසිද්ධ රැස්වීම් ශාලා එය සඳහා යොදාගත යුතු විය. එම දේවස්ථාන කුමණාකාර ක්‍රමයකට කුමණ ආකෘතියක් අනුව තනා ගත යුතුද යන ප්‍රශ්නය ඒ සමගම උද්ගත විය.

රෝම අධිරාජ්‍යය තුළ රෝම ආගමේ දේවාල හැම නගරයකම දක්නට තිබුණි. එයට නොදෙවෙනි විලාශයකට ක්‍රිස්තු භක්තිකයින්ටද හැම නගරයකම දේවස්ථාන තනා ගැනීමට ඕනෑ විය. එසේ කිරීමටද ඔවුන් පටන් ගත්හ.

එහෙත් එය සඳහා දේවාලවල ආකෘතියම ඔවුන් තෝරා ගත්තේ නැත. එම දේවාල පිටතින් බැලුවිට අතිශයින් ගාම්භීර විය.



පේලියට තැනූ කනු වලින්ද විශාල දේව රූපවලින්ද යුක්ත විය. එහෙත් ඒවායේ ඇතුලත ඉතාමත් කුඩා විය. ඒවා තුළට එක විටකට ඇතුළු වූයේ පූජකවරුන් අතලොස්සකට අමතරව ඉතාමත් සුළු පිරිසක් පමණි.

එවැනි දේවාල වලින් ක්‍රිස්තු භක්තිකයින්ට වැඩක් නොවීය. ඔවුන්ට අවශ්‍ය වූයේ මහජන කණ්ඩායම් එක විට එක් රැස් කරවා ගතහැකි විශාල ශාලාය. එමනිසා ඔවුන් තම දේවස්ථාන රෝම දේවාල අනුව නොව රෝම වරුන්ගේ ''බැසිලිකා'' යනුවෙන් හැඳින්වුන ජන රැස්වීම් ශාලා අනුව තනා ගන්නට තීරණය කළහ.

බැසිලිකා නමින් හැඳින්වුන රැස්වීම් ශාලා නඩු විභාග වලටද පොදුජන රැස්වීම් වලටද උත්සව වලටද යොදාගත හැකි වන විලාශයකට ප්‍රමාණයෙන් බොහෝ සේ විශාල විය. පිටතින් ඒවා ඉතාමත් චාම් විය. ඇතුලත කණු පේලිවලින් යුක්ත විය. පළල් වහලක් දැරීමට එවැනි කනු අත්‍යවශ්‍ය විය. ඉතාමත් බහුලව එක බිත්තියක සීමිත පෙදෙසක් ගුහාවක ස්වරූපයෙන් අර්ධ කවාකරව තනා තිබුණේය. විනිශ්චය කරුගේ හෝ රැස්වීම් නායකයාගේ ආසනය තබා තිබුනේ එතැනය.

කොන්ස්තන්තීනු රජතුමාගේ කාලය තුළ රෝමපුරයේ අරඹන ලද හැම දේවස්ථානයකටම මුල් වූයේ එම බැසිලිකා ආකෘතිය ය. ඒවා පළලට වඩා දිගින් වැඩි වූ සෘජු චතුරස්‍ර ගොඩනැගිලි විය. ඇතුල්වීමේ දොරටුව එක කෙළවරක විය. ගොඩ නැගිල්ලට ඇතුල් වෙනවාත් සමගම බැතිමතකුගේ ඇසට දිස්වුනේ ප්‍රති විරුද්ධ පැත්තේ අඩකවාකාර ගුහාවක පිහිටා තිබුණ පූජාසනය ය. ශාලාව තුළ වහල රඳවන දීර්ඝ කණු පේලි දෙකක් විය. ඒවායින් දේවස්ථානයේ බිම් පෙදෙස කොටස් තුනකට බෙදුනේය.

එලෙසම එය ප්‍රධාන මැදි ශාලාවකින්ද පටු තීරු දෙකකින්ද යුක්ත වන්නට විය. ඉංග්‍රීසියෙන් ඒ මැදි පෙදෙසම ''නැව'' යන අර්ථය ඇති ''නේව්'' යන්නෙන්ද තීරුදෙක ''කුරුළු තටු'' යන අර්ථය දෙන ''අයිල්''යන්නෙන්ද බහුලව හැඳින්වේ.

මැදි කොටසේ වහල තටු කොටස්වල වහලට වඩා උස විය. ඒ හේතුවෙන් පිටතින් බැලුවිට එය තට්ටු දෙකක ගොඩනැගිල්ලක් බඳුවිය. තටු කොටස හා මැදි කොටස අතර වූ බිත්තියේ ජනේල තනා තිබුණි. ගොඩනැගිල්ලේ ඇතුලත ආලෝකමත් කිරීමට ඒවා අවශ්‍ය විය.

ප්‍රායෝගික අගයකින් යුක්තවූ මෙම චාම් ගොඩනැගිලි ක්‍රමය රෝම අධිරාජ්‍යයේ විශේෂයෙන් බටහිර කොටසේ හැම තැනකම පාහේ යොදා ගනු ලැබුනේ ය. ශත වර්ෂ දහසකට වඩා පැරණි මෙම ආකෘතිය අද පවා බහුලව යොදාගනු ලැබේ. එහෙත් රෝම අධිරාජ්‍යයේ බටහිර කොටසේ යොදාගනු ලැබූ එකම ආකෘතිය මෙය නොවීය. දිගින් හා පළලින් එක හා සමාන වූ හරි හත රැස් දේවස්ථානද, කවාකාර බිත්තිවලින් යුක්ත වූ රවුම් දේවස්ථානද, කුරුසියක හැඩයට තනනු ලැබූ දේවස්ථානද එහි දක්නට ලැබුනෙය.

**සංස්කාරක පියතුමන් විසිනි**

ඉදිරියට .......

**දිනිත් දෙව්ශාන්**
06 ශ්‍රේණිය
සාන්ත අන්තෝනි දහම් පාසල
කීරපත්දෙණිය



## පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, A4 ( හාෆ්ෂිට් කොලවල ඇඳ ) පාසලේ හෝ දහම් පාසලේ පංති භාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම, පංතිය, පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

**බර්නාඩ් සුදර්ශන්**
08 ශ්‍රේණිය
දිව්‍ය හෘදයේ දහම් පාසල
ඇල්පිටිය





**ප්‍රගීත් නිමේෂ**
09 ශ්‍රේණිය
සාන්ත තෙරේසා දහම් පාසල
තල්විල



**නිලක්ෂි ලක්ෂානි තිසේරා**
10 ශ්‍රේණිය
සාන්ත අන්තෝනි දහම් පාසල - බටගම

**ප්‍රසාදි ඉරෝෂනී පෙරේරා**
09 ශ්‍රේණිය
වික්ෂෝප මාතා දහම් පාසල
ජා-ඇල



**දිලුනි ද සිල්වා**
05 ශ්‍රේණිය
ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමය
කොළඹ 07



# ශු. ජොහානාදාක් මුනිවරිය



**ශු සභා මාතාවගේ බැබලෙන තරු අතරින් බැටළු පාලිකාවක්, සෙබලියක් ද වන ජොහානාදාක් මුනිවරිය ප්‍රංශයේ නාමසාන්තුවරිය වන්නීය.**

උතුරු ප්‍රංශයේ උපත ලද මෙතුමිය ඇගේ පවුලේ සියල්ලන් සමඟ ඇය නිහඬ ජීවිතයක් ගත කළ අතර කුඩා කල සිටම දෙවිපියාට ප්‍රිය ප්‍රසන්න දියණියක වූවාය.

තම පවුලේ සාමාජිකයන්ගෙන් උරුම වූ එඬේරික වෘත්තියට පෙළඹුණු ඕතොමෝ කුඩා කල සිටම නිර්භීත ව කටයුතු කළාය. ඇය ජීවත් වූ අවධියේ දී නිරන්තරයෙන් ප්‍රංශය හා එංගලන්තය අතර සටන් සංග්‍රාම තිබූ අතර, ඇයට අත්‍යවශ්‍ය වූයේ තම මව්බිම නිදහස්කර, ශක්තිමත් සෞභාග්‍යමත් රටක් වනු දැකීමටය. මේ කාලයේදී ප්‍රංශයේ විසූ රාජාණ්ඩුවට වඩා එංගලන්තය ප්‍රබල වී තිබූ අතර, අවස්ථා කීපයකදී පැවති යුද්ධ හේතුවෙන් එංගලන්තයට ජය අත් වී තිබුණි.

මෙකල යෞවනියක ලෙස ජොහානාදාක් තම බැටළු පට්ටිය දක්කමින් සිටි අවස්ථාවක හදිසි ආලෝකයක් තුළින් මිහිරි ගීයක් ඇයට ඇසිණි. මෙහිදී දේවදූතයන්ගේ සහ ශුද්ධවන්තයින්ගේ කටහඬ බව තේරුම් ගත් ඇය, එම දේවහඬට අවනත වූවාය. ''යන්න ඔබ ගොස් ඔබේ රට බේරා ගන්න....'' යනුවෙන් අනාවරණයක් ඇයහට ලැබිණි.

ප්‍රථමයෙන් බියට පත්වූ ඇය, දෙවිඳුන් කෙරේ වූ දැඩි විශ්වාසයෙන් යුතුව, දෙවිඳුන් තමාගෙන් බලාපොරොත්තු වන්නේ තම රට රැක ගැනීම බව සිතූ ජොහානාදාක් තුමිය යුද ඇඳුමකින් සැරසී නිර්භීතව හමුදා සේනාංකය වෙත අසුපිටින් ගොස් නිර්භීතව යුද වැදුනාය.

මෙකල ප්‍රංශ රජුට සිංහාසනය අහිමි වී තිබූ අතර, හමුදා පිරිස්ද බියෙන් තැති ගෙන සිටියෝය.

දැඩි පරිශ්‍රමයක් හා පුහුණුවක්ද දැඩි අධිෂ්ඨානශීලී බවක් ද ප්‍රංශ සේනාංකයට ලබා දුන් ජොහානාදාක්තුමිය අභීතව යුද වැදුනාය.

මෙලෙස මෙතුමියගේ දැඩි කැපවීම හා මෙහෙයවීම යටතේ ප්‍රංශ භටයෝ ජයග්‍රහණය කළෝය. මෙලෙස ප්‍රංශ රජුට නැවත ඔටුන්න හා සිහසුන හිමිකර දීමට ඕ තොමෝ සමත්වූවාය. ඉන්පසු ඇය රජුට මෙසේ පැවසුවාය. ''රජතුමෙනි, මගේ වැඩ කොටස අවසානය. මට නැවත මගේ බැටළුවන් වෙතට යාමට අවසර දුන මැනවැ''යි කීවාය.

එහෙත් රජතුමා ඇයට අවසර නුදුන් අතර රජුගේ අනුශාසක මණ්ඩලයේ සාමාජිකාවක වූවාය. එහෙත් පසුව ඇගේ මිතුරන් පිරිසක් ඈ හට ද්‍රෝහි වී , සිය සතුරන් අතට ඇය පාවා දුන් අතර ඔවුන් විසින් දරුණු වධ ගාවිනා වලට ඇයව පාත්‍ර කරන ලදි.

ඇය විජ්ජාකාරියක් ලෙස චෝදනා නඟමින් අමු අමුවේ පුළුස්සා මරණයට පත් කරන්නට නියම කළෝය. ප්‍රංශ ජාතිකයන් අදත් ඔවුන්ගේ රට දිනා දුන් ශුද්ධවන්තිය ලෙස ජොහානාදාක් තුමියට බැති පෙම් දක්වති. මේ නිසා ම ශු. සභා මාතාව සොල්දාදුවන්ගේ ආරක්ෂක මුනිවරිය ලෙස ජොහානාදාක් මුනිවරිය සලකනු ලබන්නේය.

ඇගේ මංගල්‍යය මැයි 30 වන දිනට යෙදී ඇත.

**අසේල දසනායක විසිනි**

## ප්‍රහේලිකා අංක 38

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | 2 | | ■ | 3 |
| | ■ | | ■ | 4 | |
| 5 | 6 | | 7 | ■ | |
| ■ | | ■ | | ■ | |
| 8 | | ■ | 9 | | |
| | ■ | ■ | ■ | ■ | |

**හරහට**

1. ශු. බයිබලයේ සඳහන් වන කිසිදු නොකැපූ තම හිස කෙස්වල යෝධ ශක්තියක් තිබූ තැනැත්තාගේ නම

4. ''................ වයා හිමි තුමන් පසසන්න එතුමන්ට පැසසුම් ගී ගයන්න'' යනුවෙන් ගීතාවලියෙ සඳහන් වෙයි. හිස්තැනට සුදුසු වචනය.

5. දෙවිඳුන්ගෙන් අප ලද හැකියාවන් වර්ධනය කරගතයුතු බව .......... පිළිබඳ උපමාව මගින් ක්‍රිස්තුන් වහන්සේ පහදා දුන් සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

8. මුහුද මත ක්‍රිස්තුන් වහන්සේ වෙතට ඇවිදගෙන ගිය පේදුරුතුමා අතර මගදී මෙසේ කළ නිසා මුහුදේ ගිලෙන්නට පටන් ගත්තේය.

9. මිනිස්සු අංශභාග රෝගියාව ....... ක තබා ක්‍රිස්තුන් වහන්සේ වෙතට ගෙනාහ. මෙහි හිස් තැනට සුදුසු වචනය.

**පහළට**

1. ක්‍රිස්තුන් වහන්සේ .......හා විපත පිළිබඳව තම ශ්‍රාවකයන්ට පහදා දුන් සේක. හිස්තැනට සුදුසු වචනය.

2. ..... දෙන කන ඥානවන්තයාගේ අපේක්ෂාව වන්නේය. යනුවෙන් උපදේශකයා හෙවත් සිරාක් පවසයි.

3. ප්‍රඥාතමෝ ඇයව සොයන්නට තම රහස් ............. කරන බව උප දේශකයා හෙවත් සිරාක් පවසයි.

6. ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ උකුත් වූ පසු අරමිතියේ ජෝසෙප් උන්වහන්සේගේ සිරුර ගල් ........ තැන්පත් කළේය. හිස්තැනට සුදුසු වචනය.

7. ක්‍රිස්තුන් වහන්සේ තම අන්තිම රාත්‍රී භෝජනයට පසු තම ශ්‍රාවකයන්ගේ පාද සේදීමට පෙර උතුරු සළුව ගලවා තබා මෙය ගෙන ඉණ වටා බැඳගත් සේක.

8. ''ස්වාමින්ගේ දූතයා මරිය තුමියට ............... කළා යනුවෙන් තුන්කාල ආරාධනාවේ සඳහන් වෙයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

**(මෙම ප්‍රහේළිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. වීරාවලිය 13, උපදේශකයා හෙවත් සිරාක් 3/29, 4/11, ශු. ලූක් 6/ 20, 5 / 18, 19/ 11, ශු. මතේව් 14/31 , ශු ජුවාම් 13, ගීතාවලිය 33 )**

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා** – කිරිමැටියාගාර

## ප්‍රහේළිකා අංක 37 පිළිතුරු

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 ජෙ | රි | කෝ | 2 ව | ■ | 3 ගෝ |
| රු | ■ | ■ | 4 තු | වා | ල |
| 5 ස | ත් | 6 ව | ර | ■ | ය |
| ල | ■ | හ | ■ | ■ | කූ |
| 7 ම | 8 නා | ල | 9 යා | ■ | ■ |
| ■ | ම | ■ | 10 ම | රි | යා |

## ප්‍රහේළිකා අංක 37 - ජයග්‍රාහකයෝ

- **1 වන ස්ථානය**

  යසාරා ජයවර්ධන - 05 ශ්‍රේණිය

  සාන්ත මරියා දහම් පාසල - වැල්ලවාය

- **2 වන ස්ථානය**

  ජයනි ඔල්වියා - 10 ශ්‍රේණිය

  සාන්ත තෝමස් දහම් පාසල - කෝට්ටෙ

- **3 වන ස්ථානය**

  සඳුනි කාර්මෙල් - 11 ශ්‍රේණිය

  ශු. ඌගෝ මුනි දහම් පාසල - වීරකොඩියාන

  (තල්ගහපිටිය මීසම)


ශුද්ධවූ බයිබලය ඇසුරෙන්
චිත්‍ර කථා රචනය.. ආනන්ද කල්දේරා.
මෝසෙස්
2
දෙබස්, චිත්‍ර:- එස්.ඒ.පී. සපුආරච්චි
යාකොබ් සහ සිය පුතුන් දොළොස් දෙනා ඊජිප්තුවේ රජතුමා හමුවට පැමිණියහ...
නුඹලා කිනම් දේශයක සිට මෙහි පැමිණියෙහිද
ස්වාමීනි අපි හීබෲ ජාතිකයින්.. අපි කානාන් දේශයෙහි සිට මෙහි පැමිණියෙමි..
ස්වාමීනි අපි එඬේරුන් වන්නෙමු..
නුඹලාගේ රැකියාව
ඇයි නුඹලා කානාන් දේශයේ සිට.. මෙහි පැමිණියේ..?
ස්වාමීනි.. කානාන් හි මහා දරුණු සාගතයක් පවතී
මිනිස්සුන්ට බීමට පැන් පොදක් නැ.. අපේ බැටළුවන්ට උලා කෑමට තණකොළ වත් නැ.. ඒ සියල්ලම විනාශවෙලා. තවත් අපට එහි වාසය කිරීමට නොහැකි නිසා මෙහි ආයෙමි...
හොඳයි එසේනම් මේ ඊජිප්තුවේ ගෝෂෙන් නම් ප්‍රදේශයට ගොස් එහි නුඹලාගේ රැකියාව කරගෙන පලයල්ලා..
ඊජිප්තුවේ ගෝෂෙන් නම් ප්‍රදේශයේ පදිංචිවීමට ඊජිප්තු රජතුමාගෙන් ඔවුනට අවසර දෙන ලදී.. යාකොබ් සිය දරුවන් දොළොස් දෙනාද සමඟ ගෝෂෙන් බලා පිටත් විය...


ශු. ප්‍රැන්සිස් මුණිඳුන්ගේ
කතාව
අසීසි නගරයේ දිළින්දා
ඉදිරිපත් කිරීම – ආමල් ද සිල්වා
25
ප්‍රැන්සිස් අසීසියේ පමණක් නොව, අවට ප්‍රදේශ වලද සැරිසැරුවා. එසේ ගමන් කරද්දී තමුන්ට හමු වූ මිනිසුන් සමඟ දෙවිඳුන් ගැන කතා කළා.
අප ලබන්නේ දීමෙන්ය.., අප කමාව ලබන්නේ කමා කිරීමෙන්ය, අනන්තකාලික ජීවිතයට අප උපදින්නේ මරණයෙන්ය
සාන්ත දමියානෝ දෙව්මැදුරේ කුරුසයෙන් නික්මුණ පණිවිඩයේ සැබෑ අර්ථය දැන් ඔහුට හොඳින් වැටහී තිබුණා.
වතුපිටි කුඹුරු ආදියෙහි වැඩකරන මිනිසුන් සමඟද ඔහු දෙවිඳුන් ගැන කතා කළා. ඔහු ඔවුන්ට උදව් කර, ඔවුන් සමඟ වැඩ කර කෑමට යමක් ඔවුන්ගෙන්ම ලබා ගත්තා
එසේ නොවුනු විට හිඟමනේ ගොස් කෑමට යමක් සොයා ගත්තා
එහෙත් ඔහු කිසිවකුගෙන් මුදල් හෝ වෙන යමක් ඉල්ලුවේවත් ගත්තේවත් නැත.

මැයි මංගල්‍යය සැමරීම

මුද්දර ලෝකය හඳුනා ගනිමු

බයිබලයයි පුංචි මමයි

ගරු එස්. රන්දිල් ප්‍රනාන්දු (නි.ම.නි) පියතුමන් විසිනි

සුදුවර චරිතයක් හඳුනාගනිමු

ලොව කිතුනු කලා අසිරිය

උපමාවට ඔවදනක්

චතුරංගි අක්කා විසිනි

කිතුනු ළමා හමුව

ජේසුගෙන් ළමා ඔබට

දිළෙන මිණි මුතු

පිපෙන මල් යාය

පොඩි ෆාදර් ලියයි

ගරු නිරංජන් විජේරත්න (සා. බෙ. නි.) පියතුමා

සුදතුම් වරම් ලැබීම

සිඟිති කතාව

සිසු නායක පදක්කම් පැළැඳවීම

මමයි ජීවමාන ජේසුයි

[ දිව්‍ය සත්ප්‍රසාදීය ළමා ක්‍රියාකාරකම් ]

නිවාසාන්තර ක්‍රීඩා

අපේ ළමා පොළ

විශ්ව දින පොත

කිතුනු උරුමය

ගුරු ඔවදනක්

# ලබන සතියට

## ධර්මදූත ළමා සමාජිකයිනට මෙන්න අනගි අවස්ථාවක් !

**ශ්‍රී ලංකාවේ ධර්මදූත ළමා සමාජයේ 25වෙනි සංවත්සරය නිමිති කරගෙන නිර්මාණය කිරීමට අපේක්ෂා කරන සංයුක්ත තැටියට ගීත රචනා කිරීමට ධර්මදූත ළමා සමාජ ළමුන්ට හා සජීවක සජීවිකාවන්ට කෙරෙන සුහද ආරාධනයයි !**

**තේමාව : "දේව රාජ්‍යය ගොඩනැගීම සඳහා මිනිස් වටිනාකම් ඉස්මතු කෙරෙන ගීතයන්"**

**පුන ගැයිය : (Chorus) සහ**

**ගැයිය දෙකක් (2 verses)**

**ඔබගේ නිර්මාණය සමඟ පහත කූපනයද පුරවා 2012 පෙබරවාරි මස 29 වෙනිදාට පෙර අප වෙත එවන්න.**

නම:- ..........................................................................

ලිපිනය :- ...........................................................

ධර්මදූත ළමා සමාජ
ඒකකයේ නම :- ...................................................

මීසම :- ..................................................................

පදවිය :- ................................................................

මීසම් භාර පියතුමාගේ නම,
අත්සන හා නිලමුද්‍රාව :- ....................................

**අපගේ ලිපිනය :**
**ජාතික අධ්‍යක්ෂ පියතුමා**
**ශුද්ධාසනීය ධර්මදූත ළමා සමාජය**
**නො : 19, බැල්කම් පෙදෙස,**
**කොළඹ - 08.**
**දුරකථන අංකය : 011-2685673**

**නිවැරදිව ප්‍රහේළිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්,**
**ප්‍රහේළිකා අංක 32, ළමා ප්‍රදීපය,**
**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,**
**කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

## ඔබ එළිදක්වන පොත්පත් වලට අපෙන් ඉඩක් ...

ඔබ පාසලේ, මීසමේ දහම් පාසලේ එළි දක්වන, ළමා පොත්, සඟරා හා පුවත් පත් පිළිබඳව තොරතුරු අපට ලියා එවන්න. ඒවා ළමා ප්‍රදීපයේ පළ කිරීමට අපි සූදානම්. එම විස්තර පහත ලිපිනයට යොමු කරන්න.

**"පොත් පත්"**
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත - කොළඹ 08

## ළමා ප්‍රදීපය පාස්කු කලාපයට නිර්මාණ එවන්න.

ළමා ප්‍රදීපය විශේෂ පාස්කු කලාපය සඳහා පාස්කුව හා බැඳි ඔබගේ නිර්මාණ ( සඳැස්, නිසැදැස්, ලිපි, කෙටි කතා ) අප වෙත යොමු කරන්න. ඔබගේ නිර්මාණ මාර්තු 26 වන දිනට පෙර,

ළමා ප්‍රදීපය "පාස්කු කලාපය" අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08. යන ලිපිනයට අප වෙත එවන්න.

සංස්කාරක පියතුමා

## ඔබේ දහම් පාසල ගැන අපිට ලියලා එවන්න ...

ඔබේ දහම් පාසල පිළිබඳව තොරතුරු, දහම් පාසලේ ළමුන්, ආචාර්යය මණ්ඩලය හා සිසු නායකයින්ගේද සේයාරූ සමඟ අප වෙත යොමු කරන්න.

අපේ දහම් පාසල, ළමා ප්‍රදීපය,
අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

දහම් පාසල් හා පාසල් වල දිව බොදුන් ලැබීම් හා සුදතුම් වරම් ලැබීම් වල ඔබ එවන සෙ-යාරූ පැහැදිලි විය යුතු අතර සමූහ සේයාරුවක් පමණක් අපට එවන්න. එසේම දිව බොදුන්, සුදතුම් වරම් ලැබු ළමුන් සංඛ්‍යාවද සඳහන් කර එවන්න. ළමා ප්‍රදීපයේ පළ කිරීමට ඔබ එවන සේයා රූ පළ කිරීමේදී අප විසින් මෙහි සඳහන් කරුණු පිළිබඳව වඩාත් සැලකිලිමත් වන බව කරුණාවෙන් සළකන්න.

සංස්කාරක පියතුමා